සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sannasanews@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Commonwealth |
| BSB Number | - 3619 |
| Account Number | - 10852429 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡායා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ලියා දන්වන වගයි

### හාම්පුතුන් හා දඬබල්ලන්ගේ නාටකය

අතීතයේ සිටම බුදු දහමේ විකාශය හා විනාශය උදෙසා රාජ්‍යය හෙබවූ පුද්ගලයන් හා කණ්ඩායම් වලින් සිදුවූ අනුපමේය සේවය මෙන්ම අගතියද අප ඉතිහාසය තුළින් ඉගෙනගෙන ඇත්තෙමු අප දන්නා පරිදි බොහෝ විට බුදු දහමට ප්‍රහාර හා තර්ජන එල්ල වී තිබෙන්නේ අන්‍යාගමිකයන් ආක්‍රමණිකයන්ගෙනි. ලංකා ඉතිහාසය තුළ සිදුවූ ඒ සිළු ආක්‍රමණ හා පසුබෑම් පරාජය කිරීමට රාජ්‍යයටත් ජනතාවටත් හැකි වූයේද බුදු දහමින් ලබා තිබූ ශික්ෂණය හා පෝෂණය නිසාය.

ආක්‍රමණිකයන්ට හා අන්‍යාගමිකයන්ට විනාශ කොට යටපත් කළ නොහැකි වූ නිර්මල බුදු දහම එහි භාරකාරයන් අතින්ම ලෝක ජනතාවගේ උපහාසයට හා අපහාසයට ලක්වීම කෙතරම් ඛේදජනකද? මෑත කාලයේ සංඝ සමාජය තුළ බුදු දහම ආරක්ෂා කරගැනීම සඳහා මතු වී ඇති අර්බුදය එකිනෙකා කා කොටා ගැනීමක් දක්වා වර්ධනය වීමට හේතු සාධක ඉබේ පැනනැගුනා නොවේ. මෙහි අතීතය බෞද්ධාගමිකයන් අන්‍යාගම් වලට හැරවීමට විරුද්ධව සෝම හාමුදුරුවන් ඇරඹූ ව්‍යාපාරය දක්වා අතීතයට දිවයයි.

සෝම හාමුදුරුවන් ඇරඹි ඒ සටන ධර්ම රාජ්‍යයක් දක්වා වර්ධනය කිරීම බාරගත්තේ සිහල උරුමයයි. ඉන් පසු හෙළ උරුමයයි. තත්වය මෝරා පුපුරා ගිය පසු ඔවුන් නෑසූ කන්ව බලා සිටින්නේ අහසින් වැටුණා සේය.

දැන් සිදුව ඇත්තේ බැඳ දමා තිබූ ආගමික මුර බල්ලන් රැහැන් වලින් මිදී ගොස් තිබීමය. මේ මුර බල්ලන් බුදින්නේ රාජ භෝජනයි. ලගින්නේ රාජ මන්දිර වලයි. කිසිවකුටවත් ඔවුන් දැන පාලනය කළ නොහැකිය. පාලනය කළ හැක්කේ ඔවුන් පෝෂණය කරන හාම්පුතාට පමණකි. වැටත් නියරත් ගොයම් කන කළ මේ අවනඩුව කියන්නේ කාටදැයි ජනතාව බලා සිටිති.

මෙලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම අවිහිංසාවාදියා වූ බුදුන් වහන්සේගේ දර්ශනය ආරක්ෂා කර ගැනීම සඳහා පොලීසියක් හමුදාවක් පිහි-ටුවීම අප දකින ලෙස අමුම අමු කුණුහරුපයකි.

### මැයි දිනය හා කම්කරුවා

ජාත්‍යන්තර කම්කරු දිනය යනු කම්කරුවාගේ දිනයයි. අවාසනාවට කම්කරුවාට අයත් ඒ දිනය කම්කරුවාගේ බලය ප්‍රදර්ශනය කරන දිනයක් වනවා වෙනුවට දේශපාලන පක්ෂ වල බලය පෙන්වන දිනයක් බවට පත්ව ඇත. මෙය දැන් වෙනස් කළ නොහැකි තරමට පරිවර්තනය වී ඇත. මෙයට විකල්පයක් කිසිවකුට යෝජනා කළ හැකිද? අපේ යෝජනාව වන්නේ ඒ යන රැල්ලට එකතු වී මැයි දිනය සැනකෙළි දිනයක් කරගන්නවාට වඩා කාලයත් ධනයත් ඉතිරි කර ගනිමින් ලොවේ කොතැනක හෝ සිට කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් දිවි පිදූ සහෝදරයන් සිහිකර විනාඩියක හෝ නිශ්ශබ්දතාවකින් ඔවුනට ගරු කිරීමයි. දේශපාලන පක්ෂ පෙළපාලි වල නරි නාටක නටනවාට වඩා එය වැදගත් ක්‍රියාවක් යයි අපි සිතමු

**සංස්කාරක**

# තිතට මත් වන රටක කාන්තා හිංසනයට තිතක් කොහේද?



ශාමිලා දළුවත්ත

2014 වසර පුරා පත්තර පිටු පුරා කාන්තාවන්ට සහ ගැහැණු දරුවන්ට එරෙහිව වන හිංසන වලින් පිටු පිරවෙයි. 2011 වසර අවසාන වුයේ තංගල්ලේ දේශපාලනයේ නියැලෙන දාමරිකයෙකු හා ඔවුන්ගේ සගයන් අට දෙනෙකු විසින් මෙරටට සංචාරයට පැමිණි රුසියානු තරුණිය වික්ටෝරියා දූෂණය කොට ඇයගේ බ්‍රිතාන්‍ය පෙම්වතා මරා දැමීමෙන් පසුය. ඇය විසින් දෙන ලද සාක්ෂිය ඇසෙන විට ලංකාව යන නමටත් ලැජ්ජය.

ජාත්‍යන්තරයේ හොඳ නම රැකීමට උත්සුක වෙමින් වලි කන රාජපක්ෂ ආණ්ඩුව මෙවැනි දූෂකයන් සහ දේශපාලන දාමරිකයන් බලයට පැමිණවීම තුළින් ලංකාවේ මිනිසුන් ම්ලේච්ඡ බවට පත් කරන තරමටම ජාත්‍යන්තර අපකීර්තිය වසා ගන්නේ කෙසේද?

2008 දී පටන් ගෙන 2013 දක්වා විහිද ගිය කහවත්ත කොටකෙතන ඝාතන රැල්ලේදී කාන්තාවන් 28 දෙනෙකු දූෂණය කොට මරා දැමි□. මෙකී ඝාතන හා දූෂණ රැල්ලට වයස අවුරුදු 17 සිට අවුරුදු 85 පමණ වයස් සීමාවේ කාන්තාවන් හා ගැහැණු දරුවන් ගොදුරු විය. මෙම ඝාතන රැල්ලේ දී අවුරුදු 56ක් වයසැති මාරියා සෙල්ලයියා, අවුරුදු 52 ආරියවති, බේබිනෝනා(48) , හීන්මැණිකා (80) , කරුණාවති(66) , හීන්මැණිකේ (85) , ජයන්ති මැනිකේ(56) , බණ්ඩාර මැනි-කේ(69) , නයනා නිල්මිණි(52) , දයාවති(61) , තිලකාවති (51) , ප්‍රේමාවති(59) , පුෂ්පා කුමාරි(32) , නිල්මිණි කාවින්දිය (17) , චන්ද්‍රාවති (66) , දිල්හානි (27) , යන කාන්තාවන් ඝාතනය විය.

කිරුලපන ඇලේ දූෂණය කොට කුණු ඇලේ පා කලේ අවුරුදු හයක දැරියකි. තංගල්ල සංචාරක හෝටලයක දී අවුරුදු 14 ක පාසැල් දැරියක දූෂණය කිරීමේ වරදට තංගල්ල නගර සභා මන්ත්‍රිවරයකු ඇතුලු පස් දෙනෙක් හවුල් විය. 2013 ජනවාරි 1 වන දින අවුරුද්ද ලැබුයේ මීගමුවේ දී අවුරුදු 28 ක එක්දරු මවක් වු ටෙලිනාට්‍ය නිළියක් නිවස අසල තිබු සංගීත සන්දර්ශනය නරඹා එද්දි සිව් දෙනෙකු විසින් ඇයට මරණ බිය පමුණුවා අමානුෂික ලෙස දූෂණයට ලක් කල බව පුවත්පත්වල වාර්තා කරමිනි. ඉන් සැකක-රුවන් දෙදෙනෙක් ත්‍රිවිධ හමුදාවට අයත් විය. මින් අදහස් කරන්නේ තනිවම රාත්‍රියේ මීටර් දහයක්වත් ගමන් කිරීමට

4 වන පිටට